ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2018 ජනවාරි මස 30 වැනි දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2017 නොවැම්බර්

**සමස්ත නිරීක්ෂණ**

රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සඳහා විදේශීය ආයෝජන ඉහළ යෑම හේතුවෙන් ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් අඛණ්ඩව ඉහළ යෑම සහ සංචාරක ඉපැයීම්වල සුළු වර්ධනය, 2017 වසරේ නොවැම්බර් මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය සඳහා හිතකර ලෙස දායක විය. 2016 නොවැම්බර් මාසයේ දී අපනයන වටිනාකම අඩු අගයක් ගැනීම හේතුවෙන් 2017 නොවැම්බර් මාසයේ දී අපනයන අංක දෙකක අගයක වර්ධනයක් වාර්තා කරනු ලැබුව ද, ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් වෙළඳ හිඟය සැලකිය යුතු ලෙස පුළුල් විය. මේ අතර, මැදපෙරදිග කලාපයේ පවතින අහිතකර ආර්ථික හා භූ-දේශපාලනික තත්ත්වය හේතුවෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඛණ්ඩව පහත වැටුණි. ඒ අනුව, 2017 වසරේ නොවැම්බර් අවසානය වන විට ගෙවුම් තුලනයෙහි සමස්ත ශේෂය එ.ජ. ඩොලර් බිලියන 2.0 ක අතිරික්තයක් වාර්තා කළේය. 2017 නොවැම්බර් අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය ද, 2016 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 6.0 සිට එ.ජ. ඩොලර් බිලියන 7.3 ක් (ආනයනික මාස 4.2 කට ප්‍රමාණවත් වන පරිදි) දක්වා වර්ධනය විය.

## සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2016 නොවැම්බර් (එ.ජ.ඩො. මිලියන) | 2017 නොවැම්බර් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2016 ජන. - නොවැ. (එ.ජ.ඩො. මිලියන) | 2017 ජන. - නොවැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 809.7 | 940.9 | 16.2 | 9,450.7 | 10,340.6 | 9.4 |
| ආනයන | 1,732.1 | 1,940.4 | 12.0 | 17,366.7(ආ) | 18,931.3 | 9.0 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -922.4 | -999.5 | | -7,916.0(ආ) | -8,590.6 | |
| සංචාරක ඉපැයීම් | 287 | 287 (c) | 0.2 | 3,133 | 3,211 (ඇ) | 2.5 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 567 | 562 | -0.9 | 6,557 | 6,080 | -7.3 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | 2 | -11 | | -9 | 267 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් | 227 (ආ) | 350 | | 4,639 (ආ) | 5,369 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 8 | 140 | | 1,212 | 1,543 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | | 1,500 | 1,500 | |
| දිගුකාලීන ණය | 220 (ආ) | 210 | | 1,226 (ආ) | 1,297 | |
| විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම | - | - | | 700 | 1,000 | |
| ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම | 163 | - | | 332 | 167 | |
| විදේශීය සෘජු ආයෝජන (ඉ) | - | - | | 397 | 766 | |
| සමස්ත ශේෂය | - | - | | -653 | 2,005 | |


**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2017 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැක.
(ඈ) ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.
(ඉ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස නවය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ.

## වෙළඳ ශේෂය

2017 නොවැම්බර් මාසය තුළ වෙළඳ හිඟය පුළුල් වූ අතර, 2017 වසරේ පළමු මාස එකොළහ තුළ දී ද වෙළඳ හිඟය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පුළුල් විය. ඉන්ධන ආනයනය ඉහළ යෑම හේතුවෙන් ආනයන වියදම ඉහළ යෑම මේ සඳහා හේතු විය.

**රූප සටහන 1 : මාසික වෙළඳ ශේෂය**





**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

2017 නොවැම්බර් මාසයේ දී අපනයන ආදායම අඛණ්ඩව පස් වැනි මාසයටත් අංක දෙකක වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වුව ද, 2016 නොවැම්බර් මාසයේ දී වාර්තා වූ අඩු අපනයන ආදායම් අගය ද මෙම වර්ධනය සඳහා හේතු විය.

**රූප සටහන 2 : මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම, මුළු අපනයන වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වෙතින් මෙන්ම ඕස්ට්‍රේලියාව, හොංකොං හා එක්සත් අරාබි එමීර් රාජ්‍යය වැනි සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙතින් පැවති ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් ඇඟලුම් අපනයන ආදායම අඛණ්ඩව පස් වැනි මාසයටත් ඉහළ ගියේය. විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී. ප්ලස් පහසුකම) ප්‍රතිස්ථාපනය කිරීමෙන් අනතුරුව යුරෝපා සංගමය වෙත සිදු කළ ඇඟලුම් අපනයනවලින් ලද ආදායම අඛණ්ඩව වර්ධනය විය. ඒ අනුව, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2017 නොවැම්බර් මාසයේ දී යුරෝපා සංගමය වෙත වූ ඇඟලුම් අපනයන සියයට 13.8 කින් ඉහළ ගිය අතර, ඇමෙරිකා එක්සත් ජනපදය වෙත සිදු කළ ඇඟලුම් අපනයන සියයට 11.9 කින් ඉහළ ගියේය. තවද, නැව් සහ ගුවන් යානා සඳහා භාවිත කරන ඉන්ධනවල අපනයන පරිමාව සහ අපනයන මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. එසේම, රබර් ටයර් සහ ශල්‍ය හා වෙනත් අත්වැසුම් අපනයන ආදායම ඉහළ යෑම පිළිබිඹු කරමින් මෙම මාසය තුළ දී රබර් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය. මේ අතර, ප්‍රධාන වශයෙන්ම තේ අපනයන සාමාන්‍ය මිල හා අපනයන පරිමාව ඉහළ යෑම නිසා තේ අපනයන ආදායම කැපී පෙනෙන ලෙස වර්ධනය වීම හේතුවෙන් 2017 නොවැම්බර් මාසයේ දී කෘෂිකාර්මික අපනයන ආදායම තවදුරටත් ඉහළ ගියේය. කුරුඳු, ගම්මිරිස් සහ කරාබුනැටි සඳහා වූ සාමාන්‍ය අපනයන මිල ගණන්වල පහළ යෑමක් පැවතිය ද, අපනයන පරිමා ඉහළ යෑම හේතුවෙන් කුළුබඩු අපනයන ආදායම ඉහළ ගියේය. මීට අමතරව, යුරෝපා වෙළඳපොළ වෙත මුහුදු ආහාර අපනයනය කිරීම සඳහා පනවා තිබූ

තහනම ඉවත් කිරීමේ සහ ජී.එස්.පී. ප්ලස් පහසුකම ප්‍රතිස්ථාපනය කිරීමේ යහපත් බලපෑම පිළිබිඹු කරමින් ප්‍රධාන වශයෙන් යුරෝපා වෙළඳපොළ වෙත සිදු කළ මුහුදු ආහාර අපනයන ඉහළ යෑම හේතුවෙන් මෙම මාසය තුළ දී මුහුදු ආහාර අපනයන ආදායම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. 2017 නොවැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ භාණ්ඩ අපනයන සඳහා ප්‍රධාන වෙළඳපොළ ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය පැවති අතර මෙම රටවල් වෙත සිදු කරන ලද අපනයන මුළු අපනයන ආදායමෙන් සියයට 50 ක් පමණ විය.

## සංඛ්‍යා සටහන 2: අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2016 නොවැම්බර් (එ.ජ.ඩො. මිලියන) | 2017 නොවැම්බර් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2016 ජන. - නොවැ. (එ.ජ.ඩො. මිලියන) | 2017 ජන. - නොවැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **623.8** | **713.5** | **14.4** | **7,285.2** | **7,745.3** | **6.3** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 23.2 | 28.4 | 22.8 | 300.0 | 359.8 | 20.0 |
| සත්ත්ව ආහාර | 6.1 | 8.0 | 31.4 | 60.6 | 70.2 | 15.9 |
| රෙදිපිළි හා ඇඟලුම් | 383.1 | 424.3 | 10.8 | 4,490.5 | 4,562.0 | 1.6 |
| එයින් ඇඟලුම් | 357.3 | 399.0 | 11.7 | 4,234.7 | 4,294.1 | 1.4 |
| රෙදිපිළි | 18.6 | 17.7 | (4.8) | 180.9 | 188.0 | 3.9 |
| වෙනත් රෙදිපිළි සැකසුම් | 7.1 | 7.6 | 7.5 | 74.9 | 79.8 | 6.5 |
| රබර් නිෂ්පාදිත | 61.2 | 67.3 | 10.0 | 705.5 | 760.8 | 7.8 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 18.1 | 22.5 | 24.3 | 254.3 | 236.5 | (7.0) |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 27.0 | 28.3 | 4.9 | 292.7 | 340.8 | 16.4 |
| ප්‍රවාහන උපකරණ | 6.7 | 6.6 | (1.0) | 123.8 | 157.6 | 27.3 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 24.5 | 44.2 | 80.6 | 256.1 | 371.9 | 45.2 |
| රසායනික නිෂ්පාදිත | 8.8 | 11.8 | 33.1 | 115.1 | 134.0 | 16.4 |
| දැව සහ කඩදාසි නිෂ්පාදිත | 9.8 | 11.6 | 18.1 | 104.7 | 126.2 | 20.4 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 11.6 | 6.6 | (42.8) | 30.2 | 44.5 | 47.3 |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 13.8 | 12.9 | (6.6) | 154.4 | 144.2 | (6.6) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 4.0 | 6.8 | 68.6 | 60.6 | 66.5 | 9.7 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.6 | 11.8 | 79.7 | 82.7 | 105.7 | 27.8 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 2.1 | 2.7 | 30.4 | 31.5 | 30.8 | (2.2) |
| වෙනත් | 17.4 | 19.7 | 13.6 | 222.3 | 233.8 | 5.2 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **182.9** | **224.1** | **22.6** | **2,125.2** | **2,547.5** | **19.9** |
| තේ | 101.3 | 127.0 | 25.4 | 1,159.2 | 1,402.9 | 21.0 |
| රබර් | 3.3 | 2.3 | (29.6) | 29.4 | 35.7 | 21.1 |
| පොල් | 28.9 | 25.7 | (11.0) | 337.4 | 329.0 | (2.5) |
| කුළුබඩු | 22.4 | 33.7 | 50.1 | 285.1 | 373.6 | 31.0 |
| එළවළු | 2.1 | 1.8 | (13.8) | 24.8 | 26.4 | 6.7 |
| සකස් නොකළ දුම්කොළ | 2.4 | 1.9 | (21.1) | 28.6 | 31.5 | 10.1 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 6.6 | 8.9 | 35.0 | 108.4 | 129.3 | 19.2 |
| මුහුදු ආහාර | 15.8 | 22.8 | 43.8 | 152.2 | 219.1 | 44.0 |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **3.0** | **3.3** | **9.1** | **40.3** | **47.8** | **18.6** |
| **මුළු අපනයන** | **809.7** | **940.9** | **16.2** | **9,450.7** | **10,340.6** | **9.4** |


**මූලයන් :** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

**වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය**

2011 නොවැම්බර් මාසයෙන් පසු වාර්තා වූ ඉහළම මාසික ආනයන වියදම් අගය සනිටුහන් කරමින් 2017 නොවැම්බර් මාසයේ දී ආනයන වියදම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. ජාත්‍යන්තර වෙළඳපොළෙහි මිල ගණන් ඉහළ යෑම සහ ආනයන පරිමා ඉහළ යෑම යන කරුණු දෙකෙහිම බලපෑම හේතුවෙන් බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන වියදම කැපී පෙනෙන ලෙස ඉහළ යෑම නිසා ඉන්ධන ආනයන වියදම ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ප්‍රධාන වශයෙන් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී පහළ ආනයන වියදමක් වාර්තා කිරීම හේතුවෙන් 2017 නොවැම්බර් මාසයේ දී තිරිඟු හා ඉරිඟු ආනයන වියදම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. තවද, මෙම මාසය තුළ දී රත්‍රං ආනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් රත්‍රං ආනයන වියදම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. දේශීය වෙළඳපොළ තුළ පවතින සහල් හිඟය සපුරාලීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් 2017 නොවැම්බර් මාසයේ දී සහල් ආනයන පරිමාව තවදුරටත් ඉහළ ගියේය. කිරිපිටි ආනයන පරිමාව සහ කිරිපිටි සඳහා වූ සාමාන්‍ය මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් කිරි නිෂ්පාදිත සඳහා වූ ආනයන වියදම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. ඛනිජ නිෂ්පාදිත යටතේ වර්ගීකරණය කර ඇති සිමෙන්ති ක්ලින්කර් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය යටතේ වර්ගීකරණය කර ඇති සිමෙන්ති ආනයනය ඉහළ යෑම හේතුවෙන් ඉදිකිරීම් කර්මාන්තය හා සම්බන්ධ ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වුව ද, මෙම මාසය තුළ දී යකඩ හා වානේ ආනයනය පහළ යෑම තුළින් ඉදිකිරීම් කර්මාන්තය හා සම්බන්ධ මූල ලෝහ ආනයන වියදම පහළ ගියේය. ප්‍රධාන වශයෙන්ම යූරියා ආනයනය පහළ යෑම හේතුවෙන් 2017 නොවැම්බර් මාසයේ දී පොහොර ආනයන වියදම පහළ ගියේය. සාමාන්‍ය ආනයන මිල සහ ආනයන පරිමාව පහළ යෑම හේතුවෙන්, 2017 නොවැම්බර් මාසයේ දී අඛණ්ඩව පස් වැනි මාසයටත් සීනි ආනයනය පහළ ගියේය. තවද, ප්‍රධාන වශයෙන්ම ලොරි, ත්‍රීරෝද රථ, වාණිජ අරමුණු සඳහා යොදා ගනු ලබන කැබ් රථ හා

**රූප සටහන 3 : මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන් :** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගනු ලබන ට්‍රැක්ටර වැනි ප්‍රවාහන උපකරණ ආනයනය පහළ යෑමත්, වැසි සහ දුම්රිය මාර්ග ඉදිකිරීම් කටයුතු සඳහා යොදා ගනු ලබන ද්‍රව්‍ය ආදී වෙනත් ප්‍රවාහන උපකරණ සඳහා ආනයන වියදම 2016 නොවැම්බර් මාසයේ දී ඉහළ යෑම තුළින් ඇති වූ පදනම් බලපෑමත් හේතුවෙන් මෙම මාසය තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය. 2017 නොවැම්බර් මාසය තුළ ඉන්දියාව, චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සිංගප්පූරුව සහ ජපානය ශ්‍රී ලංකාවේ ආනයන සඳහා ප්‍රධාන ප්‍රභවයන් ලෙස පැවති අතර එම රටවල් වෙතින් සිදු කළ ආනයන, මුළු ආනයනවලින් සියයට 58 ක් පමණ විය.

# සංඛ්‍යා සටහන 3: ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2016 නොවැ. (එ.ජ.ඩො. මිලියන) | 2017 නොවැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2016 ජන. - නොවැ. (එ.ජ.ඩො. මිලියන) (ආ) | 2017 ජන. - නොවැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **387.9** | **407.7** | **5.1** | **3,964.8** | **4,069.0** | **2.6** |
| ආහාර හා පාන වර්ග | 141.1 | 174.9 | 23.9 | 1,484.9 | 1,659.5 | 11.8 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.7 | 26.2 | 1,408.6 | 19.6 | 272.1 | 1,289.9 |
| එයින් සහල් | 1.0 | 25.3 | 2,503.5 | 11.2 | 260.2 | 2,228.3 |
| කිරි නිෂ්පාදිත | 23.2 | 40.6 | 75.3 | 219.7 | 291.0 | 32.4 |
| එළවළු | 30.5 | 39.4 | 29.1 | 333.1 | 327.4 | (1.7) |
| සීනි සහ රසකැවිලි | 30.2 | 20.0 | (33.7) | 322.2 | 233.8 | (27.4) |
| මුහුදු ආහාර | 19.2 | 15.5 | (19.4) | 218.2 | 199.2 | (8.7) |
| කුළුබඩු | 9.9 | 6.4 | (34.6) | 124.0 | 84.4 | (31.9) |
| තෙල් සහ මේද | 3.3 | 4.5 | 38.3 | 33.8 | 42.0 | 24.5 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 23.1 | 22.1 | (4.1) | 214.4 | 209.7 | (2.2) |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 246.8 | 232.8 | (5.7) | 2,479.9 | 2,409.4 | (2.8) |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 49.7 | 51.1 | 3.0 | 486.7 | 474.4 | (2.5) |
| රථවාහන | 64.0 | 62.2 | (2.8) | 736.4 | 677.4 | (8.0) |
| විදුලි සංදේශ උපකරණ | 32.4 | 31.3 | (3.5) | 227.1 | 254.0 | 11.9 |
| රෙදිපිළි හා උපාංග | 29.6 | 25.7 | (13.0) | 339.7 | 344.9 | 1.5 |
| රබර් නිෂ්පාදිත | 8.7 | 8.2 | (6.8) | 102.7 | 85.1 | (17.1) |
| ආලේප වර්ග හා සේදුම් ද්‍රව්‍ය | 6.4 | 5.2 | (17.8) | 79.8 | 70.7 | (11.4) |
| මුද්‍රණ ද්‍රව්‍ය හා ලිපිද්‍රව්‍ය | 3.9 | 4.0 | 1.0 | 37.5 | 37.0 | (1.2) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 52.1 | 45.1 | (13.4) | 470.1 | 465.9 | (0.9) |
| **2. අන්තර් භාණ්ඩ** | **882.9** | **1,072.5** | **21.5** | **8,866.5** | **10,242.0** | **15.5** |
| ඉන්ධන | 221.9 | 306.4 | 38.1 | 2,152.8 | 2,994.6 | 39.1 |
| එයින් බොරතෙල් | 34.9 | 95.7 | 173.9 | 514.3 | 608.3 | 18.3 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 142.1 | 185.2 | 30.4 | 1,469.3 | 2,167.4 | 47.5 |
| ගල්අඟුරු | 44.9 | 25.5 | (43.2) | 169.2 | 218.9 | 29.4 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 28.2 | 82.7 | 193.0 | 440.6 | 677.0 | 53.6 |
| එයින් රත්‍රන් | 17.9 | 72.7 | 306.5 | 318.7 | 570.7 | 79.0 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 258.3 | 251.1 | (2.8) | 2,477.0 | 2,491.7 | 0.6 |
| තිරිඟු හා ඉරිඟු | 1.8 | 58.2 | 3,051.8 | 223.5 | 353.9 | 58.3 |
| ඛනිජ නිෂ්පාදිත | 16.8 | 35.5 | 110.8 | 201.0 | 201.5 | 0.3 |
| ආහාර සැකසුම් | 15.5 | 31.3 | 102.4 | 206.4 | 277.1 | 34.3 |
| රබර් හා ඒ ආශ්‍රිත උපාංග | 18.9 | 23.5 | 24.1 | 260.5 | 264.1 | 1.4 |
| සකස් නොකළ දුම්කොළ | 5.5 | 8.9 | 62.0 | 62.7 | 61.3 | (2.2) |
| පොහොර | 17.8 | 4.9 | (72.6) | 129.6 | 86.7 | (33.1) |
| මූල ලෝහ | 69.4 | 40.9 | (41.0) | 396.2 | 503.5 | 27.1 |
| වෙනත් | 228.6 | 229.0 | 0.2 | 2,316.1 | 2,330.6 | 0.6 |
| **3. ආයෝජන භාණ්ඩ** | **460.5** | **459.7** | **(0.2)** | **4,523.6** | **4,475.9** | **(1.1)** |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 243.9 | 243.6 | (0.1) | 2,489.6 | 2,391.0 | (4.0) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 149.5 | 157.6 | 5.5 | 1,420.6 | 1,460.5 | 2.8 |
| ප්‍රවාහන උපකරණ | 66.2 | 57.9 | (12.5) | 607.5 | 617.0 | 1.6 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.9 | 0.5 | (37.8) | 5.9 | 7.4 | 25.8 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.8** | **0.5** | **(39.7)** | **11.9** | **144.4** | **1,110.3** |
| **මුළු ආනයන** | **1,732.1** | **1,940.4** | **12.0** | **17,366.7** | **18,931.3** | **9.0** |


**මූලයන් :** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

### ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්


2017 නොවැම්බර් මාසයේ දී සංචාරක පැමිණීම් 2016 නොවැම්බර් මාසයට සාපේක්ෂව සුළු වැඩිවීමක් වාර්තා කළ අතර, මාසය තුළ සංචාරක ඉපැයීම් ද සුළු වශයෙන් වර්ධනය විය. ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය සහ ප්‍රංශය යන රටවල් 2017 වසරේ නොවැම්බර් මාසය දක්වා සංචාරකයින් පැමිණි ප්‍රධාන මූලාශ්‍ර වූ අතර, රට රටවලින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව මෙම කාලපරිච්ඡේදයේ දී පැමිණි මුළු සංචාරකයින්ගෙන් සියයට 52.0 ක් විය. වසරේ පළමු මාස එකොළහ තුළ දී පැමිණි මුළු සංචාරකයින් සංඛ්‍යාව සහ මුළු සංචාරක ඉපැයීම් 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී ඉහළ ගියේය. මේ අතර, 2017 නොවැම්බර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සියයට 0.9 කින් අඩු විය. සමස්තයක් ලෙස, 2017 වසරේ නොවැම්බර් මාසය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 7.3 කින් අඩු විය.

**රූප සටහන 4 : සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර පහ**




මූලය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 5 : සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




මූලයන් : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, වාණිජ බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

### මූල්‍ය ලැබීම්


ජංගම ගිණුමේ අපේක්ෂිත වර්ධනයට වඩා අඩු වර්ධනයක් තිබියදීත්, 2017 වසරේ නොවැම්බර් මාසයේ දී ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම තවදුරටත් ශක්තිමත් විය. 2017 වසරේ මාර්තු මාසයේ සිට වාර්තා වූ ධනාත්මක ප්‍රවණතාවය තවදුරටත් පවත්නා ගනිමින් රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ වෙත වූ විදේශීය ආයෝජන අඛණ්ඩව නව වැනි මාසයට ද ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. මීට අමතරව, රජය වෙත ලැබුණු ශුද්ධ

දිගුකාලීන ණය ප්‍රමාණය ද වසරේ පළමු මාස එකොළහ තුළ දී ඉහළ ගියේය. මේ අතර, නොවැම්බර් මාසයේ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශ ආයෝජන ශුද්ධ ගෙවීමක් වාර්තා කළ අතර, දේශීය සමාගමක් විසින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වෙනත් සමාගමක විදේශ හිමිකම අත්පත් කර ගැනීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුව ද, 2017 වසරේ පළමු මාස එකොළහ තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශ ආයෝජන 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ ශුද්ධ පදනම මත ආයෝජන ඉවත් කර ගැනීමට සාපේක්ෂව සැලකිය යුතු ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

**ජාත්‍යන්තර සංචිත**

2017 වසරේ නොවැම්බර් මාසය අවසාන වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය 2016 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 6.0 සිට එ.ජ. ඩොලර් බිලියන 7.3 ක් දක්වා වර්ධනය වූ අතර එය ආනයනික මාස 4.2 ක් මූල්‍යනය සඳහා ප්‍රමාණවත් විය. බැංකු අංශයේ විදේශ වත්කම් ද ඇතුළත් මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2016 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 8.4 සිට එ.ජ. ඩොලර් බිලියන 9.7 ක් දක්වා වර්ධනය වූ අතර එය ආනයනික මාස 5.6 කට ප්‍රමාණවත් විය.

**රූප සටහන 6 : දළ නිල සංචිත සහ සමස්ත ශේෂය**





මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

### විනිමය අනුපාතිකයේ හැසිරීම

ශ්‍රී ලංකා රුපියල, 2017 වසරේ දී වාර්තා වූ සියයට 2.0 ක අවප්‍රමාණය වීමට සාපේක්ෂව 2018 ජනවාරි 29 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 0.6 කින් අවප්‍රමාණය විය. තව ද, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල වෙනත් ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ද අවප්‍රමාණය විය.

**රූප සටහන 7 :**
**එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4 :**
**අනෙකුත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2017 දෙසැම්බර් මස 29 දක්වා අධිප්‍රමාණය (+) / අවප්‍රමාණය (-) |
|---|---|
| එ.ජ. ඩොලර් | -0.6% |
| යූරෝ | -4.2% |
| ස්ටර්ලින් පවුම් | -5.3% |
| ජපන් යෙන් | -3.9% |
| කැනේඩියානු ඩොලර් | -2.3% |
| ඕස්ට්‍රේලියානු ඩොලර් | -4.2% |
| ඉන්දියානු රුපියල් | -1.3% |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව